පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය

2026 සැප්තැම්බර් 25 වැනි දින.

විසර්ජන පනත් කෙටුම්පත (2027) පාර්ලිමේන්තුවේ රැස්වීම් සඳහා වැඩසටහන

(i)	**පළමුවැනි වර කියවීම**	2026.10.07 (බදාදා)
(ii)	**දෙවැනි වර කියවීම** ***(අය වැය කථාව)***	**2026.11.12** (බ්‍රහස්පතින්දා)
(iii)	**දෙවැනි වර කියවීම පිළිබඳ විවාදය** *(වෙන් කළ දින හත)*	2026.11.13 (සිකුරාදා)
		2026.11.14 (සෙනසුරාදා)
		2026.11.16 (සඳුදා)
		2026.11.17 (අඟහරුවාදා)
		2026.11.18 (බදාදා)
		2026.11.19 (බ්‍රහස්පතින්දා)
	දෙවැනි වර කියවීම පිළිබඳ ඡන්ද විමසීම *(අපර භාග 6.00)*	**2026.11.20 (සිකුරාදා)**
(iv)	**පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාව** *(වෙන් කළ දින දහ නවය)*	2026.11.21 (සෙනසුරාදා)
		2026.11.23 (සඳුදා)
		2026.11.25 (බදාදා)
		2026.11.26 (බ්‍රහස්පතින්දා)
		2026.11.27 (සිකුරාදා)
		2026.11.28 (සෙනසුරාදා)
		2026.11.30 (සඳුදා)
		2026.12.01 (අඟහරුවාදා)
		2026.12.02 (බදාදා)
		2026.12.03 (බ්‍රහස්පතින්දා)
		2026.12.04 (සිකුරාදා)
		2026.12.05 (සෙනසුරාදා)
		2026.12.07 (සඳුදා)
		2026.12.08 (අඟහරුවාදා)
		2026.12.09 (බදාදා)
		2026.12.10 (බ්‍රහස්පතින්දා)
		2026.12.11 (සිකුරාදා)
		2026.12.12 (සෙනසුරාදා)
	තුන්වැනි වර කියවීම පිළිබඳ ඡන්ද විමසීම *(අපර භාග 6.00)*	**2026.12.14 (සඳුදා)**

විසර්ජන පනත් කෙටුම්පත (2027) විවාදය පැවැත්වෙන කාලය තුළ රැස්වීම් වේලාවන්

<u>සඳුදා සිට සෙනසුරාදා දක්වා</u>

ස්ථාවර නියෝග 22(1) සිට (6) පරිදි වැඩකටයුතු	පූ.භා. 9.30 - පූ.භා. 10.00
වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න	පූ.භා. 10.00 - පූ.භා. 10.30
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න	පූ.භා. 10.30 - පූ.භා. 11.00
විවාද කාලය	පූ.භා. 11.00 - අ.භා. 6.00
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව	අ.භා. 6.00 - අ.භා. 6.30

(සඳුදා සිට සෙනසුරාදා දක්වා දිවා ආහාර විවේකය අ.භා 12.30 සිට අ.භා. 1.00 දක්වා)

(සිකුරාදා දිවා ආහාර විවේකය අ.භා 12.30 සිට අ.භා. 1.30 දක්වා වේ.)

(2026 නොවැම්බර් 20 සිකුරාදා සහ දෙසැම්බර් 14 සඳුදා සභාව කල් තබන අවස්ථාවේ යෝජනා නොමැත.)

විසර්ජන පනත් කෙටුම්පත (2027) පිළිබඳ විවාදය සඳහා පොදු කොන්දේසි

- 2026 නොවැම්බර් 16 සඳුදා අපර භාග 3.00 ට හෝ ඊට පෙර කාරක සභා අවස්ථාවේ සංශෝධන ඉදිරිපත් කිරීම;
- දෙවැනි වර කියවීමේ සහ කාරක සභා අවස්ථාවේ විවාදය සම්බන්ධයෙන් අවශ්‍ය කාර්යපටිපාටිමය යෝජනා, පිළිවෙළින්, 2026 ඔක්තෝබර් 22 බ්‍රහස්පතින්දා හෝ 23 සිකුරාදා සහ නොවැම්බර් 18 බදාදා හෝ 19 බ්‍රහස්පතින්දා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ ඇතුළත් කිරීම;
- විපක්ෂ නායක කාර්යාලය විසින් සකස් කරනු ලබන කාරක සභා අවස්ථාවේ වැඩසටහන ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට හැකි ඉක්මනින් ලබා දීමට විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් ඉල්ලා සිටීම.
- දෙවැනි වර කියවීමේ සහ පූර්ණ පාර්ලිමේන්තු කාරක සභා අවස්ථාවේ විවාදය සඳහා:—

  දෙවනවර කියවීම - ආණ්ඩු පක්ෂය 60% සහ විපක්ෂය 40% සහ

  කාරක සභා අවස්ථාව - ආණ්ඩු පක්ෂය 40% සහ විපක්ෂය 60%
- දෙවැනි වර කියවීමේ සහ පූර්ණ පාර්ලිමේන්තු කාරක සභා අවස්ථාවේ විවාදය තුළ දී පූ. භා. 10.00 සිට පූ. භා. 10.30 දක්වා දිනකට වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පහක් (05) පමණක් ඇසීම;
- පසුගිය වසරේ දී මෙන්ම විසර්ජන පනත් කෙටුම්පත පිළිබඳ විවාදය තුළ දී පමණක් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27(2) යටතේ මතු කරන ප්‍රශ්න එකක් (01) පමණක් එක් රැස්වීම් දිනයකට ඇසීමට ඉඩ සැලසීම;
- පූර්ණ පාර්ලිමේන්තු කාරක සභා අවස්ථාවේ දී, අමාත්‍යාංශයක වැය ශීර්ෂයක් සඳහා බෙදීමක් ඉල්ලා සිටින්නේ නම්, පෙර අවස්ථාවන්හිදී සිදු කළ පරිදි, පෙර දින මධ්‍යහ්න 12.00 ට හෝ ඊට පෙර ලිඛිතව ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාගේ ලේකම්වරයා වෙත දැනුම් දීම;
- සියලු අමාත්‍යාංශවල වැය ශීර්ෂ සම්බන්ධ ඡන්ද විමසීම් අදාළ දිනය අවසානයේ දී අ.භා. 6.00ට පැවැත්වීම;
- අ.භා. 6.00 සිට අ.භා. 6.30 දක්වා සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න නොමැතිව සභාව කල් තබන අවස්ථාවේ යෝජනා පමණක් ගැනීම; සභාව කල් තබන අවස්ථාවේ යෝජනා සඳහා ආණ්ඩුවට සහ විපක්ෂයට 50:50% අනුපාතය ලබාදීම සහ යම් දිනක කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් නොකළහොත්, විසර්ජන පනත් කෙටුම්පත පිළිබඳ විවාදය සභාවේ අවසරය ඇතිව අ.භා. 6.30 දක්වා පවත්වාගෙන යාම;
- **පනත් කෙටුම්පත් හැර,** ආණ්ඩුවේ වෙනත් වැඩ කටයුතු, නියෝග, රෙගුලාසි, රීති, නිවේදන වැනි අනු නීති සහ අනෙකුත් යෝජනා සහ යෝජනා සම්මතයන් අදාළ අමාත්‍යාංශවල වැය ශීර්ෂ සමඟ සම්මත කිරීම;
- ආණ්ඩුවට අවශ්‍යතාවයක් ඇති වුවහොත්, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ පූර්ව අවසරය සහිතව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල දක්වා ඇති ක්‍රියා පටිපාටියට අනුකූලව පනත් කෙටුම්පත් සම්මත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

විසර්ජන පනත් කෙටුම්පත පිළිබඳ විවාදයේ දී 50:50% අනුපාතය මත පදනම්ව සභාව කල් තබන අවස්ථාවේ යෝජනා සඳහා අවස්ථාව වෙන් කිරීම

(i) **දෙවැනි වර කියවීමේ විවාදය** *(වෙන් කළ දින ගණන හතයි)*

2026.11.13 (සිකුරාදා)	-	**විරුද්ධ පාර්ශ්වය**
2026.11.14 (සෙනසුරාදා)	-	**ආණ්ඩු පාර්ශ්වය**
2026.11.16 (සඳුදා)	-	**විරුද්ධ පාර්ශ්වය**
2026.11.17 (අඟහරුවාදා)	-	**ආණ්ඩු පාර්ශ්වය**
2026.11.18 (බදාදා)	-	**විරුද්ධ පාර්ශ්වය**
2026.11.19 (බ්‍රහස්පතින්දා)	-	**ආණ්ඩු පාර්ශ්වය**
2026.11.20 (සිකුරාදා)	**-**	**මෙදින යෝජනාවක් නොමැත** *(දෙවැනි වර කියවීමේ ඡන්ද විමසීම අ.භා. 6.00 ට)*

(ii) **පූර්ණ පාර්ලිමේන්තු කාරක සභා අවස්ථාව තුළ දී** *(වෙන් කළ දින ගණන දහ නවයයි)*

2026.11.21 (සෙනසුරාදා)	-	**විරුද්ධ පාර්ශ්වය**
2026.11.23 (සඳුදා)	-	**ආණ්ඩු පාර්ශ්වය**
2026.11.25 (බදාදා)	-	**විරුද්ධ පාර්ශ්වය**
2026.11.26 (බ්‍රහස්පතින්දා)	-	**ආණ්ඩු පාර්ශ්වය**
2026.11.27 (සිකුරාදා)	-	**විරුද්ධ පාර්ශ්වය**
2026.11.28 (සෙනසුරාදා)	-	**ආණ්ඩු පාර්ශ්වය**
2026.11.30 (සඳුදා)	-	**විරුද්ධ පාර්ශ්වය**
2026.12.01 (අඟහරුවාදා)	-	**ආණ්ඩු පාර්ශ්වය**
2026.12.02 (බදාදා)	-	**විරුද්ධ පාර්ශ්වය**
2026.12.03 (බ්‍රහස්පතින්දා)	-	**ආණ්ඩු පාර්ශ්වය**
2026.12.04 (සිකුරාදා)	-	**විරුද්ධ පාර්ශ්වය**
2026.12.05 (සෙනසුරාදා)	-	**ආණ්ඩු පාර්ශ්වය**
2026.12.07 (සඳුදා)	-	**විරුද්ධ පාර්ශ්වය**
2026.12.08 (අඟහරුවාදා)	-	**ආණ්ඩු පාර්ශ්වය**
2026.12.09 (බදාදා)	-	**විරුද්ධ පාර්ශ්වය**
2026.12.10 (බ්‍රහස්පතින්දා)	-	**ආණ්ඩු පාර්ශ්වය**
2026.12.11 (සිකුරාදා)	-	**විරුද්ධ පාර්ශ්වය**
2026.12.12 (සෙනසුරාදා)	-	**ආණ්ඩු පාර්ශ්වය**
2026.12.14 (සඳුදා)	**-**	**මෙදින යෝජනාවක් නොමැත** *(තෙවැනි වර කියවීමේ ඡන්ද විමසීම අ.භා. 6.00ට)*

පාර්ලිමේන්තුවේ සභානායක ලේකම්
2026.09.25 දින.